# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,464 - 2006 සැප්තැම්බර් 22 වැනි සිකුරාදා - 2006.09.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 1190 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1191 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 1192 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 සැප්තැම්බර් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 සැප්තැම්බර් මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටර්නි බලය අවලංගු කිරීම

නාවල, 6 වන පටුමග, අංක 24/2 හි පදිංචි, අබේවර්ධන ආරච්චිගේ සුමනසේන *හෙවත්* සුමනසේන අබේවර්ධන සහ නුගේගොඩ, නාවල, විජයබා මාවත අංක 30ඒ දරන තැන පදිංචි ඇලන් වෙලගෙදර වන අපට, බත්තරමුල්ල තලංගම දකුණ, සපුමල් පෙදෙස, අංක 793 හි පදිංචි වික්‍රමගේ දොන් ජගත් වික්‍රම යන අයව අපගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරමින් සිරිමෙවන් වර්ණකුල වීරසූරිය ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කළ අංක 115 සහ 2006 ජනවාරි 16 දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරනලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමු.

තවද, එකී බලපත්‍රය යටතේ මින් ඉදිරියට ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට අප වග නොකියන බව වැඩිදුරටත් ප්‍රකාශ කරමු.

අබේවර්ධන ආරච්චිගේ සුමනසේන *හෙවත්*
සුමනසේන අබේවර්ධන,
ඇලන් වෙලගෙදර.

2006 ක් වූ අගෝස්තු මස 21 වැනි දින දීය.

09-683

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

පිළියන්දල, කොළඹ පාරේ, අංක 34 දරන ස්ථානයේ පදිංචි මහීපාල ආරච්චිගේ විල්ප්‍රඩ් මහීපාල වන මම, පිළියන්දල, කොළමුන්න, මඩපාත පාරේ, අංක 1/58, දරන ස්ථානයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ ධනපාල හේරත් යන අයට ලබාදී ඇති කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එච්. ගුණසිරි විසින් සහතික කරන ලද අංක 229 හා වර්ෂ 1999 නොවැම්බර් මස 30 වන දිනැති ඇටර්නි බලය මෙයින් අවලංගු කර සිටින බව ද, එකී ලේඛනය මෙතැන් පටන් කිසිදු බල පැවැත්මක් නොවන බව ද ශ්‍රී ලංකා ජනරජයේ සියළු පුරවැසියන්ටත් මෙයින් දන්වා සිටින බව සියල්ලෝම මෙයින් දැන ගනිත්වා.

එම්. ඒ. ඩබ්. මහීපාල.

09-684

---

දෙහිවල, අත්තිඩිය, කහවිට මාවතේ, අංක 22 හි පදිංචි දාමින්ද සජිත් ප්‍රියදර්ශන දී ගමගේ වන මම, වසර දෙකක ප්‍රතිඥාන ලිපිකරුවෙකුව පුහුණුව ලැබ නොතාරිස්වරුන් පිළිබඳ අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත් සියළු ශ්‍රී ලංකා වාසී මහජනතාව වෙතත් ගෞරව පූර්වකව දැනුම් දෙමි.

දාමින්ද සජිත් ප්‍රියදර්ශන දී ගමගේ.

09-732

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

ගෝනකුඹුර පාරේ, වැලිමලුව, ලෙල්ලොපිටිය හි පදිංචි මස්ඉඹුල මොහොට්ටාලගේ උපාලි ධම්මික වන මම, රත්නපුර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුල්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 අධිකාරිය වන නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තිය ප්‍රකාර මෙතැන් සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

එම්. එම්. යූ. ධම්මික.

2006 ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින,
ගෝනකුඹුර පාර, වැලිමළුව, ලෙල්ලොපිටිය.

09-722

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙර කරනු ලබන දැන්වීම

අඟුලුගහ, හරුමල්ගොඩ බටහිර පදිංචි වල්පිට ගමගේ ලාල් වන මා, ගාල්ල දිස්ත්‍රික්කයේ මහාධිකරණ කලාපයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් වරයෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් ආඥාපනතේ 107 වන අධිකාරියේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව සියළු දෙනා වෙත දන්වා සිටිමි.

ලාල් වල්පිට ගමගේ.

2006 සැප්තැම්බර් මස 08 වැනි දින,
හරුමල්ගොඩ - බටහිර,
අඟුළුගහ.

09-721

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම පිළිබඳ දැනුම්දීම

හික්කඩුව, ගාලු පාරේ, සී වීව් හෝටලය, අංක 295 දරන ස්ථානයේ පදිංචි ගොන්සල් කෝරාලගේ නිමල් වික්කේරා වන මම මෙයින් ප්‍රකාශ කර සිටින වග නම්.–

මා විසින් අංක 25 හා 1999.07.09 දිනැති ප්‍රියන්ත ත්‍රිකාවල, ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රයෙන් හික්කඩුව, වවුලාගොඩ, අංක 18/2, හි පදිංචි ග්ලැඩිස් නානායක්කාර වික්කේරා නමැති මගේ මව වෙත ලබා දී තිබුණු සියලුම බලතල මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ට කරන අතර, අද පටන් මින් මතු එකී ග්ලැඩිස් නානායක්කාර වික්කේරා යන අය විසින් මා වෙනුවෙන් යැයි කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බවත්, බැඳී නොසිටින බවත් ය.

ගොන්සල් කෝරාලගේ නිමල් වික්කේරා.

09-737

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

## කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### 2007 වර්ෂය සඳහා රා සහ විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් සහ විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළදී පවත්නා සෑම සුරාබදු කොන්දේසිවලටත් යටත්ව, 2007 වර්ෂය තුළදී පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන රා තැබෑරුම්වල සහ විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිලදී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2006.09.14 දින පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. (අ) සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයේ විය යුතුය :

(ආ) ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත්කර ලබා ගන්නා නිල කුවිතාන්සියක් ; සහ

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් සහ වත්කම් පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල සහ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(ඈ) ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතුය:-

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතුය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත්‍ර අංකය ද යෙදිය යුතුය.

(iii) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතුය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙකු ම ටෙන්ඩර් පෝරමය සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සියත්, වත්කම් පිළිබඳ සහතිකයත් සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවරේ මුදුනේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත්වීමට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ" වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතුය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුයි.

05. ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින ප. ව. 2.00 ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. මුළු මුදල මා නමින් පුඩලූඔය මහජන බැංකුවේ වර්ෂයක ස්ථිර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතුය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් 'ආරක්ෂිත චෙක්පත්' ස්වරූපයෙන් ගෙවිය යුතුය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

08. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙන ම පැහැදිලිව දැක්විය යුතුය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් ඒවා 2006 ඔක්තෝබර් මස 13 යන දින පෙ. ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකිය.

ජානක ධර්මකීර්ති,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ.

2005 අගෝස්තු මස 23 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන වේලාව* | *ටෙන්ඩර් ඇප තැන්පත් මුදල රු.* |
|---|---|---|---|
| *රා තැබෑරුම :* | | | |
| 1. කඩදොරපිටිය | කඩදොර පිටිය ග්‍රාමය තුළ | 2006.09.14 පෙ. ව. 10.30 | 1,000 0 |
| 2. ඕතලාව | තෝරා ගනු ලබන ස්ථානය සම්බන්ධව මුදල් හා කොත්මලේ ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබා ගත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. | පෙ. ව. 10.30 | 1,000 0 |
| 3. කටුකිතුල | කටුකිතුල ග්‍රාමය තුළ | පෙ. ව. 10.30 | 1,000 0 |
| *විදේශ මත්පැන් තැබෑරුම :* | | | |
| පුඩළුඔය | පුඩළුඔය නගර සභාව, අංක 6 කොට්ඨාසය තුළ | 2006.09.14 පෙ. ව. 10.30 | 3,000 0 |

09-666

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ5/2558/කේවයි2/902.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.05.28 *ගැසට් පත්‍රයේ* සහ 2004.10.02 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.10.14 වෙනි දින පස්වරු 3.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ, දූල්ලෑව පිහිටි නායකඳුවේ හේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. බෝගහපිටිය විසින් සැකසුණු 1997.08.08 දින හා අංක 85 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 3, රූ. 0, පර්. 16 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ එය මත පිහිටි සියලුම

දේත් සමග වේ. මෙම ඉඩම් කොටස මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 466/174 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 08 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

09-730/5

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ4/4907/කේවයි3/667.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.05.11 *ගැසට් පත්‍රයේ* සහ 2006.07.03 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.10.14 වෙනි දින පෙරවරු 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මහනුවර කරලියැද්ද පාරේ, වළාල ග්‍රාමයේ වරිපනම් අංක 174 දරන ස්ථානයේ පිහිටි කංකානියාගේ කුඹුර සහ කංකානියාගේ කුඹුර වනාත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. එම්. නවරත්න බණ්ඩා විසින් සැකසුණු 1991.12.08 දින හා අංක 92 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 13.8 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 584/256 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 08 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

09-730/4

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ5/5480/කේවයි3/769.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.11.25 *ගැසට් පත්‍රයේ* සහ 2006.02.28 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.10.14 වෙනි දින පස්වරු 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ වල්ලිවල පිහිටි කළුගොල්ල එස්ටේට් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් සැකසුණු 1995 අගෝස්තු 10-16 දිනයන් හා අංක 3279 දරන පිඹුරේ කැබලි අංක 77 ඒ ලෙස දැක්වෙන බලයලත් මිනින්දෝරු ඊ. අයි. එස්. රාජකරුණා විසින් 2000.07.13 දින තබන ලද සටහන අනුව ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 20 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 510/160 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, ප්‍රධාන පාරේ සිට දිවෙන වෙන් කරන ලද පාරේ මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 08 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

09-730/3

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ4/3186/කේවයි3/289.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.05.11 *ගැසට් පත්‍රයේ* සහ 2006.07.17 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.10.14 වෙනි දින පෙරවරු 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගෝනාවල ග්‍රාමයේ පිහිටි කොසඹගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එන්. බී. ඩී. වැත්තෑව විසින් සැකසුණු 1998 මැයි හා අංක 2285 දරන පිඹුරේ කැබලි අංක 30 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 14.50 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 692/265 යටතේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මිනින්දෝරු එන්. බී. ඩී. වැත්තෑව විසින් සැකසුණු 1998.01.28 දින හා අංක 2221 දරන පිඹුරේ කැබලි අංක 2 ද, 1998.01.08 දින හා අංක 2212 දරන පිඹුරේ කැබලි අංක 1 ද, 1998.02.25 දින හා අංක 2239 සහ 2240 දරන පිඹුරුවල කැබලි අංක 1 මතින් හිමි මාර්ග අයිතිය ද සමග වේ. තවද, ඉහත කී අංක 2285 දරන පිඹුරේ කැබලි අංක 277 මතින් හිමි මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 08 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

09-730/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 4/56558/ඉසැඩි4/841.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.06.18 *ගැසට් පත්‍රයේ* සහ 2004.11.29 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.10.14 වෙනි දින පස්වරු 4.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගල්ලෑල්ල පිහිටි කම්මල්ගොඩවත්ත *හෙවත්* කම්මල්ගොඩවත්ත සහ තිබ්බටුවාව නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. එම්. නවරත්න බණ්ඩා විසින් සැකසුණු 1992.03.15 දින හා අංක 124 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, පර්. 6.6 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එම් 373/230 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 08 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

09-730/1

---

## මහජන බැංකුව-පිටකොටුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ නිදන කාමර 2 ක අගනා නිවාසය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ ආදායම් පාලක නිළධාරි (ඩී. ආර්. ඕ.) කොට්ඨාසය ඇතුළත කොළඹ මහ නගර සභා සීමාවේ නාගරික කොට්ඨාස අංක 38 බම්බලපිටියේ පිහිටි ඇල්ප්‍රඩ් පෙදෙසේ, වරිපනම් අංක 39-2/2 දරන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ නිදන කාමර 2 ක යුනිට් 8 වශයෙන් ලකුණු කොට දක්වා ඇති නිවාස පරිශ්‍රය බලයලත් මිනින්දෝරු එම්. එස්. ටී. පී. සේනාධීර විසින් මැන සාදන ලද 1974 ජනවාරි 23 දාතම හා අංක 732 දරන සහාදිපත්‍ය පිඹුරේ සඳහන් පරිදි (වර්ග අඩි 1225 ක බිම් ප්‍රදේශය).

පහත දැක්වෙන පොදු ද්‍රව්‍ය මුල පහසුකම් ද හා සමගය. උතුරට : පියගැට පෙළේ දකුණු බිත්තියේ මැද සහ 'Z' ලෙස ලකුණු කොට ඇති වේදිකාව ද, නැගෙනහිරට : පියගැට පෙළේ නැගෙනහිර බිත්තියේ මැද සහ 'Z' ලෙස ලකුණු කොට ඇති වේදිකාව ද, දකුණට : පියගැට පෙළේ දකුණු බිත්තියේ මැද සහ 'Z' ලෙස ලකුණු කොට ඇති වේදිකාව සහ බටහිරට : පියගැට පෙළේ බස්නාහිර බිත්තියේ මැද සහ 'Z' ලෙස ලකුණු කොට ඇති වේදිකාව ද සිවිලිමට ඉහළින් අංක 39-2/1, දරන දෙවන මහලේ මහල් නිවස ද සහ පහළින් පියගැට පෙළේ පොළවේ මැද සහ 'Z' ලෙස ලකුණු කොට ඇති වේදිකාව මායිම් වන වර්ග අඩි 440 ක බිම් ප්‍රමාණයක් සහිත පියගැට පෙළ සහ 'Z' ලෙස ලකුණු කොට ඇති වේදිකාව සමග පොදු පහසුකම් පොදුවේ හවුලේ භාවිතා වන එකී ඒකකය.

1. යුනිට් 8-වරිපනම් අංක 39-2/2, 1225/7335 න් කොටස, 16.7% වශයෙන් කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන් ඒ 3/104 යටතේ ලියාපදිංචි කොට ඇති මහජන බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය පරිදි 2006 ඔක්තෝබර් මස 9 වැනි සඳුදා පෙ. ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ *ගැසට් පත්‍රයේ* 1999.04.16 දින ද, ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් පුවත්පත්වල 1999.03.26 දින ද, පළකරන ලද වෙන්දේසි යෝජනා දැන්වීමට සහ රජයේ *ගැසට් පත්‍රයේ* 2006.09.22 වැනි දින පළ කරන ලද විකුණුම් නිවේදනයට ද අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය* - සාර්ථක ගැණුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගාස්තු මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු දේශීය අළෙවි බද්ද 1% (සියයට එක) දේශීය අලෙවි බද්ද,
3. විකුණුම් මිලෙන් 2 ½% (සියයට දෙකහමාරක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ද,
4. ලිපිකරු හා නිවේදක ගාස්තුව රු. 500 ද,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද,
6. අලෙවි සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූව) විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත කොළඹ 1 ආදිපාද වීදියේ, අංක11 හි මහජන බැංකුව, කලාප කාර්යාලය (බස්නාහිර පළාත 01) සහකාර සාමාන්‍යාධිකාරි වෙත ගෙවිය යුතුය. දුරකතන අංක : 074-717008-9/2393678.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැකිය.

එකී මුදල ඉහත දක්වා ඇති පරිදි දින 30 ක් ඇතුළත ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල රාජසන්තක කොට දේපළ නැවත වි කිණීමේ අයිතිය බැංකුව සතුය.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස්වරු සහ බ්‍රෝකර්
විශේෂඥ වෙන්දේසිකරු, තක්සේරුකරු
සහ දේපළ නියෝජිත.

අංක 381 1/1, ගාලු පාර, කොළඹ 4,
දුරකතනය අංකය : 2591167 දුරකතන/ෆැක්ස් : 2584874, 2500838.
ක්ෂණික ඇමතුම් : 077 2250422.

09-734

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-කෝට්ටේ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දා වූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද, 2002.09.04 දින සහ අංක 1734 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුමිත් ප්‍රියන්ත හල්විටිගේ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මා වෙත පවරා දී ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලු මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2006.10.09 දින පෙ. ව. 10.30 ට ඇරඹෙන පරිදි එකී ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ, කඩුවෙල උප කාර්යාලය තුළ තලාහේනේ පිහිටි ඉබ්බන්වලවත්ත සහ ඉඩමට බලයලත් මානක එස්. ඉද්දමල්ගොඩ විසින් සාදන ලද 1985.03.21, 1985.04.03, 1985.05.10, 1985.06.12 දින සහ අංක 2091 දරන පිඹුරේ දක්වා ඇති බෙදා වෙන් කළ ලොට් 39 දරන ඉඩමේ ගොඩනැගිලි සහ එහි ඇති සියලු දේත් සමග වේ. ප්‍රමාණය පර්චස් 12 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2005.06.10 වැනි දින දරන *ගැසට් පත්‍රය* සහ 2005.06.22 වැනි දින ද අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*—වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් 10% ද, 2. පළාත් ආයතන ගාස්තු වශයෙන් 1% ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 ½% ද, 4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද, 5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීම හා සහතික කිරීම වෙනුවෙන් නොතාරිස් ගාස්තුව රු. 2,000 ක් ද වේ.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල, ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ හා අයකර ගැනීම) සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 470, ටී. බී. ජයා මාවත, කොළඹ 10 වෙත ලබාදිය යුතුය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු කළමණාකරු-නීති (අයකර ගැනීම), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකතන අංකය : 2661815, 2661816.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුලු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

දුරකතන අංකය : 2863121.

09-702/1

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

ඇරැව්වල පන්නිපිටියේ වසන කන්දනගේ දොන් අමරදාසට අයත් අංක 289 ලෙස ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම අ. 0, රූ. 3, පර්. 22.

රුපියල් නවලක්ෂ හතලිස් හය දහස් එකසිය හතලිස් අටක් (රු. 9,46,148) මුදලක් ද, 2003.01.06 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වර්ෂයකට 24% බැගින් පොලිය සමග මුළු මුදල විත්තිකරු විසින් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු බව ද එකී තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මුල් මුදල හා පොලිය සහිත වූ මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වනතුරු නෛතික පොලිය ද, ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කරන ලද බැවින් උසාවි වියදම් හා වෙන්දේසිකරුගේ ගාස්තුව අයකර ගැනීම පිණිස අංක 289, ඇරැව්වල, පන්නිපිටියේ වසන කන්දනගේ දොන් අමරදාසට විරුද්ධව සීමාසහිත සෙලින්කෝ වෙන්චර කැපිටල් සමාගම, අංක 277, යූනියන් පෙදෙස, කොළඹ 2 විසින් කොළඹ බස්නාහිර පළාතේ දිසා අධිකරණයේ පවරන ලද අංක 16993/එම් බී දරන නඩුවෙන් මා වෙත නිකුත් කරන ලද නියෝගය ඉහත සඳහන් දේපළ වර්ෂ 2006.10.20 වැනි දින පෙරවරු 11.00 කතිසමට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ පන්නිපිටිය-පිළියන්දල මහ පාරට යාව ඇරැව්වල පිහිටි අලුබෝගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක මර්වින් සමරනායක විසින් අංක1980 දෙසැම්බර් මස 10 වැනි දින සාදන ලද අංක 120 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1, 2, 3 දරන ඒකාබද්ධ බිම් කොටස්වලට මායිම්, උතුරට : පිළියන්දල-පන්නිපිටිය මහ පාරද, නැගෙනහිරට : එම්. ඊ. චන්ද්‍රපාලට අයත් අලුබෝගහවත්ත, දකුණට : කුඹුර සහ බස්නාහිරට : අලුබෝගහවත්ත සහ කේ. දොන් ඩැනියෙල්ට අයිති දෙමටගහවත්ත යන මායිම් තුළ පිහිටි රූඩ් තුන, පර්චස් විසිදෙක (අ. 0, රූ. 3, පර්. 22) ක් විශාල ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දැනට ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1547/165 හි ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසිය හැකි මාර්ගය*.–පන්නිපිටිය මොරකැටි හන්දියේ සිට ඇරැව්වල පාරේ කිලෝමීටර් 2 ක් පමණ ගිය විට පන්නිපිටියේ පිළියන්දල මහාපාරට යාව අංක 289 දරන ඉඩම.

*ගෙවීමේ ක්‍රමය*.–වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතුය :

1. 25% ගැණුම් මුදලින් ද,
2. 1% පළාත් පාලන ආයතන ගාස්තු සහ වැට් බද්ද ද,
3. 2 ½% විකුණුම් මුදලින් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ද,
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීම හා සහතික කිරීම වෙනුවෙන් නොතාරිස් ගාස්තුව රු. 2,000 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 75% ක මුදල ඉහත සඳහන් නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වැඩි විස්තර සඳහා දමිත් තෙන්නකෝන් මහතා, සෙලින්කෝ සංවර්ධන බැංකුව, 5 වන මහළ, සෙලින්කෝ නිවස, අංක 69, ජනාධිපති මාවත, කොළඹ 1. දුරකතන අංක 2388388, 0777222457 න් විමසන්න.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුලු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

දුරකතන අංකය : 2863121.

09-702/2

---

### ලංකා බැංකුව

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම**

වත්තේගම, ඊරියගස්තැන්න වත්ත හි පදිංචි රත්කැටිගේ සේනාරත්න විජේසිරි මයා හා ජයන්ති විජේසිරි මහත්මියට අයත් දේපළ

යොමු අංකය : ණය/558/84.

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජරජයේ 2004.10.29 දිනැති අංක 1365 දරන *ගැසට් පත්‍රයේ* හා 2004.10.18 දිනැති , "දිනමිණ", "තිනකරන්" හා "ඩේලිනිවුස්"යන පුවත්පත් වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව මුල් මුදල් ශේෂය ද විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ගාස්තු හා එකී ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයෙහි විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය පිහිටි ස්ථානයේදීම 2006.10.18 වෙනි දින පෙ. ව. 11.30 ට මහනුවර, ටොරිංටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පල්ලේ ගම්පහ කෝරළේ, නාරන්දන හි පිහිටි, මහනුවර බලයලත් මිනින්දෝරු තැන වන එස්. සී. කේ. ආර්. මිස්සෝ මහතා විසින් සාදන ලද 1948 ජුනි මස 20 වැනි දිනැති අංක 2420 දරන පිඹුරේ කැබලි 9 යනුවෙන් පෙන්නුම් කර ඇති,

ඊරියගස්තැන්න වත්තෙන් කොටසක් වන සියලු පැතිවලටම එකී පිඹුරේ කැබලි 4 මායිම් වූ රූඩ් තුනයි පර්චස් තිස්පහක (අක්. 0, රූ. 3, පර්. 35) ක වපසරියෙන් යුක්ත වන අතර, එකී කැබලි 9 අළුත් මැනීම අනුව, බලයලත් මිනින්දෝරුතැන වන සිසිල් ධූල්වල මහතා විසින් සාදන ලද 1983 පෙබරවාරි 20 දිනැති අංක 1690 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති එකී පිඹුර අනුව උතුරු-නැගෙනහිර, දකුණු-නැගෙනහිර, දකුණු-බස්නාහිර හා උතුරු-බස්නාහිරට බලයලත් මිනින්දෝරු එස්. සී. කේ. ආර්. මිස්සෝ මහතා විසින් සාදන ලද 1948 ජුනි 20 වැනි දිනැති අංක 2420 දරන පිඹුරේ කැබලි 4 ලෙස පෙන්නුම් කර ඇති ඉඩමේ ඉතිරි කොටස ද මායිම් වූ බෙදාවෙන් කරන ලද එකී පිඹුරේ පෙන්නුම් කර ඇති පාර මත හා දෙසට පාර පාවිච්චි කිරීමේ අයිතිය සමඟ වූ, සියලු නිශ්චිත ඉඩම් කොටස, එහි තුළ ඇති ගොඩනැගිලි, වගාවන් හා සෑම සියලු දේ ද වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ. 460/126 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. යූ. බණ්ඩාර,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

09-707

---

## කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - අම්බලන්තොට ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක්

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කලහේ තල්පේ පත්තුව පිහිටි ගාල්ල දිසා අධිකරණයේ බෙදුම් නඩු අංක පී /6091 දරන නඩුවේ වාර්තාගත වූ බලයලත් මානක ඒ. වීරසිංහ විසින් 1995 අගෝස්තු මස 20 වැනි දින සාදන ලද අංක 344 දරන පිඹුර පරිදි පරගහවත්ත *හෙවත්* ගොඩපරගහවත්ත ඉඩමේ වෙන් කරන ලද ලොට් ඒ සහ බලයලත් මානක ඩී. වීරසේකර විසින් 1985 ඔක්තෝබර් 14, නොවැම්බර් 07, 18 සහ 20 දිනයන්හි සාදන ලද අංක 2161 දරන පිඹුරේ දෙල්ගහවත්ත *හෙවත්* කනත්තවත්ත ඉඩමේ ලොට් අංක 1 දරන ඒකාබද්ධ ඉඩම් දෙකෙහි පිහිටි ගොඩනැගිලි, වගාවන් යන සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 'බී' දරන ඉඩම බලයලත් මානක ඒ. වීරසිංහ විසින් 2001 සැප්තැම්බර් මස 07 වැනි දින සාදන ලද අංක 827 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් තිස්හතයි දශම හයක් (අ. 0, රූ. 1, පර්. 37.6) හෝ හෙක්ටයාර් 0.1963 ක ප්‍රමාණයෙන් යුක්ත වේ.

කලුතොටගේ අමරවීර ණයකරු හැටියට ද, ඔහු විසින් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2006 ක් වූ ඔක්තෝබර් මස 17 දින ප. ව. 1.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.07.21 රජයේ *ගැසට් පත්‍රයේ* ද, දිවයින, ද අයිලන්ඩ් සහ තිනකරන් පත්‍ර ද විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2006.09.22 දින රජයේ *ගැසට් පත්‍රය* ද, ලංකාදීප සහ ද අයිලන්ඩ් පත්‍ර ද බලන්න.

*ඉඩමට පිවිසීම.*– ගාල්ල සිට අකුරැස්ස මාර්ගයේ කිලෝමීටර් 7 ක් පමණ ගොස් කලහේ රජයේ විදුහල පසුකර පදින්නොරුව සමුපකාර වෙළඳ සැල අසල ඇති 5 වන කිලෝමීටර් කණුව ළඟින් වමට ඇති පාසල් පටුමඟට පිවිසෙන්න. මෙම ඉඩම ප්‍රාදේශීය සභා මාර්ගයේ දකුණු පැත්තේ ඇති 3 වන ඉඩම වන අතර ප්‍රධාන මාර්ගයේ සිට දුර මීටර් 50 ක් පමණි.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි :

(1) ගැණුම් මිලෙන් සියයට (10%) ද,
(2) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%)ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ද,
(4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සකස් කිරීම සඳහා රු. 2,000 ද,
(5) ලිපිකරු, සෝෂක වේතනය රු. 500 ද,
(6) සියළුම ප්‍රචාරක වියදම් ද,
(7) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී, කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අම්බලන්තොට ශාඛාවේ හෝ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය,
රාජ්‍ය හා වාණිජ බැංකු,
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකතන/ෆැක්ස් අංකය :2445393.

කළමනාකරු,
කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
අංක 129, තිස්ස පාර,
අම්බලන්තොට.
දුරකතන අංක : 047-2223816,
047-2223818-9.
ෆැක්ස් අංකය : 047-2223817.

09-680

## ලංකා බැංකුව

## නිවරැදි කිරීමයි

ලංකා බැංකුව පදියපැලැල්ල ශාඛාව මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.09.08 දිනැති අංක 1462 දරන *ගැසට් පත්‍රයේ* I කොටස (IIආ) ඡෙදයෙහි පළකරන ලද වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීමෙහි හයිෆොරස්ට් මිනරල් වෝටර් කොම්පැනියේ හවුල්කරු වන කැලේ කෝරලාල ගෙදර උපාලි ජයසූරිය යන නම කැලේ කෝරාලෙලා ගෙදර රම්බණ්ඩා යනුවෙන් නිවැරැදි විය යුතුය.

ඩී. ඒ. දයානන්ද,
කළමනාකරු.

ලංකා බැංකුව,
පදියපැලැල්ල ශාඛාව.

09-706

---

## මහජන බැංකුව - මාතර උයන්වත්ත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත, 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මාතර නගර සභා සීමාව තුළ, හක්මණ පාරේ, ගබඩා වීදිය පිහිටි වරිපනම් අංක 28/3 දරන වටිනා ඉඩම සහ ගොඩනැගිලි මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2006.10.09 දින පෙ. ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

### දේපල පිළිබඳ විස්තර

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර නගර සභා සීමාව සහ කඩවත් සතර තුළ ගබඩාවීදියේ පිහිටි හක්මණ පාරේ, වරිපනම් අංක 28/3 දරන වේවැල්පොකුණවත්ත නමැති ඉඩම බෙදූ අංක 1 දරන ඉඩම් කැබැල්ල (වී. 13381 දරන බෙදුම් නඩුවට ගොනුකරන ලද) 1988.01.26 දිනැති, එම්. එච්. පී. සිරිවර්ධන බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 630 දරන පිඹුර සහ මෑතදී මැන සාදන ලද 1989.05.08 දිනැති එම්. එච්. පී. සිරිවර්ධන බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 272 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිහක් (අක්. 0, රූ. 0, පර්. 30)විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දෑ ද සමග අඩි 8 සහ 20ක් පළලැති අංක 272 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 4 හි මාර්ග අයිතිය ද වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 428/82 යටතේ ලියාපදිංචි වී ඇත.

2. ඉහත කී ගබඩා වීදියේ හක්මණ පාරේ, වරිපනම් අංක 28/3 දරන වේවැල්පොකුණ වත්ත නමැති ඉඩමේ කැබලි අංක 2 සඳහා පී. 13381 දරන බෙදුම් නඩුවට ගොනු කරන ලද 1988.01.26 දිනැති එම්. එච්. පී. සිරිවර්ධන බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 630 දරන පිඹුර සහ මෑතකදී මැන සාදන ලද එකී බලයලත් මිනින්දෝරු මහතාගේ 1989.05.08 දිනැති අංක 272 දරන පිඹුර ප්‍රකාර, පර්චස් දහයක් (අක්. 0, රූඩ්, 0 පර්. 10) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සෑම සියලු දෑ ද, අංක 272 පිඹුරේ සඳහන් කැබලි අංක 4 දරන අඩි 8 සහ 20ක් පළලැති පාරේ මාර්ග අයිතිය ද වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 428/83 හි ලියාපදිංචි වී ඇත.

*රජයේ ගැසට් පත්‍රයේ* 2002.01.11 දින ද, දිනමිණ පුවත්පතේ 2002.11.02 දින පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– මාතර හක්මණ පාරේ උයන්වත්ත මහජන බැංකුව පසුකර යාර 50ක් පමණ ගොස් නැවත දකුණට වැටී ඇති පාරේ තවත් යාර 25ක් පමණ ගියවිට මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, මාතර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 041-2222792, 2222822 හා 2224773

ෆැක්ස් අංකය : 041-2222688

හිමිකම් ඔප්පු සහ වෙනත් ආදල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය.

ඉහත සඳහන් කරන ලද පරිදි, සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත්, දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.
දුරකථන අංක 041-2228731

09-739

---

## රුහුණ සංවර්ධන බැංකුව - හක්මණ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2006.10.10 දින පෙ. ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

## උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

01. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවාපත්තුවේ කණුමුල්දෙනියේ පිහිටි ගල්ගොඩේවත්තේ නොබෙදූ හක්මණ - වලස්මුල්ල පාරේ යටිපැත්තේ කැබැල්ල නමැති ඉඩම, බලයලත් මිනින්දෝරු එස්. එල්. ගලප්පත්ති මහතා විසින් මැන සාදන ලද අංක 4029 ඒ හා 1991.09.08 දිනැති සැලැස්ම ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 01 දරන රූඩ් එකයි, පර්චස් විසි තුනක් (අ. 0 රූ. 1 පර්. 23) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු යනාදී සියලුම දේ සම්පූර්ණයෙන් ද වේ.

වැඩි විස්තර සඳහා 2006.01.12 දින *රජයේ ගැසට් පත්‍රයද,* 2006.04.28 දින දිනමිණ, තිනකරන් හා දි අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– හක්මන වලස්මුල්ල ප්‍රධාන මාර්ගයේ මීඇල්ල මංසන්ධිය පසුකර කි. මී. 01ක් පමණ ඉදිරියට ගිය විට පාරේ වම්පස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382 ඒ, දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී මහතාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි, දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත්, දැනටමත් ගැණුම් මුදලින් ගෙවා ඇති 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209.

ජී. පී. ආනන්ද,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.
දුරකථන අංක : 041-2228731

09-731

## මහජන බැංකුව - ප්‍රධාන කාර්යාල ශාඛාව සහ කෑගල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකුරු කෝරලේ මාවත පත්තුවේ, කෑගල්ල නගර සහා සීමාව තුළ නාගරික කොට්ඨාශ, අංක 1 රංවල කොළඹ, මහනුවර මාර්ගය ඔස්සේ පිහිටි බටහේන සහ මුතුපෝරුවේ හේන *නොහොත්* "පොඩියා හිටිය වත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් විසින් සාදන ලද අංක 891/කේජී දරන පිඹුරේ ලොට් 3 හා ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ අගනා ඉඩම් කොටස් 2 ප්‍රමාණයෙන් ලොට් 3 අක්. 0 රූඩ් 1 පර්. 23 සහ ලොට් 1 අක්. 0 රූඩ් 0 පර්. 5 ක ඉඩම්.

*ඉඩමට පිවිසෙන අන්දම.*– කෑගල්ල ශාන්ත ජෝශප් විද්‍යාලය අසල සිට කොළඹ දෙසට යාර 50ක් පමණ ගියවිට සමුපකාර සංගමයේ පිරවුම් හල ඉදිරිපිට පරණ ටාසන් බස් සමාගමේ ගොඩනැගිල්ල හමුවේ. ලොට් 1 එම ගොඩනැගිල්ලට යාබදව ද, ලොට් 2 එකී ලොට් 1 පිටුපස ද ඇත.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය පරිදි ඉහත කී දේපල මා විසින් 2006 ඔක්තෝබර් මස 7 වන සෙනසුරාදා පෙ. ව. 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2000.11.24 දින රජයේ ගැසට් පත්‍රයේ සහ 2000.11.15 දින "ඩේලිනිව්ස්" හා 2000.11.13 දින "දිනමිණ" පුවත්පත්වල පළ කරන ලද වෙන්දේසි යෝජනාවට සහ 2006.09.22 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද විකුණුම් නිවේදනයට අවධානය යොමු කරන්න.

*ගෙවන පිළිවෙළ.*– මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගාස්තු මුදලින් ගෙවිය යුතුය :

1. මිළ තීන්දු වූ වහාම ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ අලෙවි බදු වශයෙන් 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් (සියයට දෙකහමාරක්),
4. විකුණුම් පිරිවැය පිළිබඳ සමානුපාතික වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
5. ගැණුම් මිළෙන් ඉතිරි 90% (සියයට අනූව) වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත, කොළඹ 1, ආදිපාද වීදියේ අංක 11, මහජන බැංකුව, කලාපීය කාර්යාලයේ (බස්නාහිර කලාප 01) සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 2393678, 2435977, 2387068, 2387848.

ඉහත සඳහන් කළ පරිදි එකී මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිළෙන් 10%ක (සියයට දහයක) මුදල ආපසු නොගෙවීමටත් දේපල නැවත විකිණීමටත් බැංකුවට අයිතිය ඇත.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්, විශේෂඥ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා දේපළ නියෝජිත.

අංක 381 1/1, ගාලු පාර, කොළඹ 04,
දුරකථන අංකය : 2591167
දුරකථන/ෆැක්ස් : 2500838, 2584874.
ක්ෂණික ඇමතුම් : 077-2250422

09-735

## ඩී එෆ් සී සී බැංකුව
## (කලින් ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ ගම්මඩුව ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගමට අයත් දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 10563 දරන ඇපකරය යටතේ උකස් කරන ලද දේපල විස්තර**

බදු අයිතිය මත මධ්‍යම පළාත, නැගෙනහිර මාතලේ දිස්ත්‍රික්කයේ අඹන් ගහ කෝරළයේ ගම්මඩුව ග්‍රාමයේ පිහිටි ගම්මඩුව එස්ටේට් (වත්ත) යනුවෙන් හඳුන්වනු ලබන මිනින්දෝරු ජී. එස්. එම්. එම්. පාදෙණිය මහතා විසින් සහතික කරන ලද 1997 දෙසැම්බර් මස 29 දින හා ප්ලෑන් අංක 68/97 දරන ඇපකරය යටතේ ගෙවීම් සිදුවී නොමැත. ඩී. එෆ්. සී. සී. බැංකුව විසින් අප වෙත පවරන ලද බලතල අනුව ලොට් අංක 1, 2, 3 සහ 4 යනුවෙන් නිරූපිත ඉඩම් කොටස.

එහි පිහිටි ගම්මඩුව එස්ටේට්වලට අයත් බංගලාව, ලයින් කාමර, කාර්යාල බර කිරන කාමර සහ අනෙකුත් ගොඩනැගිලි, ගස්කොළන්, වැවිලි ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග ගමමඩුව ජ්ලාන්ටේෂන්ස් (පුද්ගලික) සමාගම, මොරටුව ලියාපදිංචි කාර්යාලය විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලද ණය අංක 10563 දරන 2004 ඔක්තෝබර් මස 12 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. ජී. ආනන්ද මහතා විසින් සහතික කළ ලොට් අංක 1, 2 සහ 3 - හෙක්ටයාර් 205.3296
ලොට් අංක 4 - හෙක්ටයාර් 45.4548

2006 ඔක්තෝබර් මස 12 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* මිල තීන්දුවනවාත් සමගම, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුය :

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් වන විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2%ක් (සියයට දෙකහමාරක්),
4. රු. 23,000ක් නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
7. විකිණීමේ ගාස්තු සහ වෙනත් ගාස්තු ඇත්නම්.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් අධිකාරියක් මගින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද, සමග අදාල පරිදි වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඩී.එෆ්. සී. සී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව වෙතින් විමසන්න.

දුරකථන අංකය : 011-2440366.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී වරලත්
වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය* :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර
දුරකථන අංකය : 081-2227593

*නගර කාර්යාලය* :
අංක 55ඒ, ධර්මපාල මාවත,
කොළඹ 03.
දුරකථන/ෆැක්ස් අංකය : 011-2441761
දුරකථන/ෆැක්ස් අංකය : 011-2448526 ඊ මේල් : samera@sri.lanka.net

09-723